ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව

காணிஉபயோகக்கொள்கைத்திட்டமிடல்தி
ணைக்களம்

Land Use Policy Planning Department

# 2013

# කාර්ය සාධන වාර්තාව

# செயற்திறன்அறிக்கை

# Performance Report

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

**காணிஉபயோகக்கொள்கைத்திட்டமிடல்திணைக்களம்**

**Land Use Policy Planning Department**

# 2013

# කාර්ය සාධන වාර්තාව

## செயற்திறன்அறிக்கை

## Performance Report

# පටුන


1.හැඳින්වීම

1.1 දැක්ම

1.2 මෙහෙවර

1.3.අරමුණු

1.4.කාර්යභාරය

2. සංවිධාන ව්‍යුහය

3.මානව සම්පත් කළමනාකරණය

3.1 කාර්ය මණ්ඩල සංයුතිය

3.2 ස්ථාන මාරුවීම්

3.3 ආයතනික තොරතුරු

3.4 මානව සම්පත් සංවර්ධනය

4.මූල්‍ය කළමනාකරණය

4.1.වැය ඇස්තමේන්තුව -2013

4.2.භෞතික සම්පත් කළමනාකරණය -2013

5.සංවර්ධන කටයුතු

5.1.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම (ඉඩම් පරිහරණ ගැටළු හදුනා ගැනීම,ඒවා අවම කිරීමට වැඩසටහන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.)

5.2.දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් කමිටු පැවැත්වීම.

5.3.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැළසුම් කමිටු පැවැත්වීම.

5.4.ග්‍රාමීය ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශන පිහිටුවීම

5.5.බිම් කට්ටි මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශන පිහිටුවීම

5.6 හායනයට පත් ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන්

5.7 ඉඩම් පරිහරණ සැළසුම්කරණය පිළිබඳ පාසැල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

5.8.ඉඩම් යෝග්‍යතා වාර්තා සැකසීම.

5.9. විශේෂ ව්‍යාපෘති

5.10.වාර්ෂික වැඩ සැළැස්ම පිළිබඳ පුහුණු වැඩමුළුව පැවැත්වීම.

5.11 .දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය

# ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව

## 01.හැදින්වීම

ශ්‍රී ලංකාව සඳහා විද්‍යාත්මක භූමි පරිහරණ සැළසුම් ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා වර්ෂ 1983 දී ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් අංශය ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශයේ ඒකකයක් වශයෙන් පිහිටුවන ලදී.මෙම විෂයයේ කාලීන වැදගත්කම හා කාර්යභාරය පුළුල් වීමත් සමගම මෙම ආයතනය 2010 වසරේ සිට දෙපාර්තමේන්තුවක් ලෙස උත්ශ්‍රේණිගත කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය නාරාහේන්පිට පිහිටා ඇති අතර දිස්ත්‍රික් කාර්යාල 25 කින් යුක්ත වේ.දෙපාර්තමේන්තුවේ සිදු කරන කාර්යයන් වඩාත් විධිමත් කිරීම සඳහා 2005 වර්ෂය තුලදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් පරිහරණ සැළසුම් සහකාර නිලධාරීන් 245 දෙනෙකු බඳවා ගත් අතර තවදුරටත් ක්ෂේත්‍ර වැඩ කටයුතු පුළුල් කිරීම සඳහා උපාධිධාරී අභ්‍යාසලාභී පදනම යටතේ 2013 වර්ෂයේ සංවර්ධන නිලධාරීන් ලෙස 148 දෙනෙකු බඳවා ගෙන දීප ව්‍යාප්තව අනුයුක්ත කර ඇත.

### 1.1.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම

"ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ථ සහ තිරසාර ලෙස පරිහරණය කිරීම."

### 1.2.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ මෙහෙවර ප්‍රකාශය

භූමිය පරිහරණය කරන්නන්ද ඇතුළුව අපගේ සියළු පාර්ශවකරුවන් තෘප්තිමත් වන සේ කාර්යක්ෂම මෙන්ම සේවයට කැපවූ කාර්ය මණ්ඩලයක් විසින් සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර සහ ප්‍රශස්ථ ලෙස භූමිය පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැළසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

### 1.3.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු 05 කි.

01.ශ්‍රී ලංකාව සඳහා සම්මත කර ගෙන ඇති ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සැකසීම.

02.ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ සැළැස්මක් සැකසීම.

03.සීමිත සම්පතක් වූ භූමිය මානව යහපත පිණිසත් පාරිසරික සමතුලිතතාවය රැකෙන පරිදි භාවිතා කිරීමට හැකි වන සේ උචිත තාක්ෂණික මග පෙන්වීම සිදු කිරීම.

04.භූමිය පදනම් කරගත් සංවර්ධන සැළසුම් වලදී එම සම්පත් ආරක්ෂාව හා මතු පැවැත්ම තහවුරු වන පරිදි කටයුතු කිරීමට අදාළ නිර්දේශ නිකුත් කිරීම.

05.විද්‍යාත්මක භූමි පරිහරණ සැළසුම්කරණය පිලිබඳව දැනුම පුහුණුව හා අධ්‍යානය පුළුල් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 1.4ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

මෙම දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යයන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

(01.)ප්‍රධාන කාර්යයන් වශයෙන් ගැනෙන විශාල මට්ටමින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැළසුම් කටයුතු

(02.)අතිරේක කාර්යයක් වශයෙන් සැලකෙන කුඩා පරිමාණ ඉඩම් පරිහරණ සැළසුම් කටයුතු

මේ පිළිබඳ විස්තර සැකවින් පහත දැක්වේ.

**විශාල පරිමාණ ඉඩම් පරිහරණ සැළසුම් කටයුතු**

පළාත් දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමෙන් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීම මේ යටතට ගැනේ.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම සහ උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ අනුව දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත.

**කුඩා පරිමාණ ඉඩම් පරිහරණ සැළසුම් කටයුතු**

මේ යටතේ තෝරාගත් ග්‍රාමීය ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරණ සැළසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම,හායනයට පත්ව ඇති කෘෂිකාර්මික බිම් පුනරුත්ථාපනය සඳහා සැළසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීමත්,රාජ්‍ය ආයතන හා රජයේ පාසැල් පරිශ්‍රයන් වල ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශන ස්ථාපිත කිරීම.සහ විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම අනුව භාවිතා නොකර තිබෙන භූමි ප්‍රදේශ සඳහා භූමි යෝග්‍යතා අධ්‍යයන වාර්තා ලබා දීමත් සිදු කෙරේ.

**ඉහත ප්‍රධාන කාර්යයන් වලට අමතරව එම කාර්යයන් වඩාත් පහසු කිරීම සඳහා**

01.විවිධ මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් කටයුතු සඳහා පාදක වන ඉඩම් තොරතුරු දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම

02.දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලීන කිරීම.

03.ඉඩම් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම පිලිබඳව රාජ්‍ය නිලධාරීන්,ගොවි ප්‍රජාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම.

04.ඉඩම් පරිහරණ ගැටලු අවම කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් පරිහරණ කමිටු ස්ථාපිත කර පවත්වාගෙන යාමද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

# 03.මානව සම්පත් කළමනාකරණය

## 3.1.කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුරු සංඛ්‍යාව | පෙර වසරේ සිටී සංඛ්‍යාව | 2013 වර්ෂය තුළ සිදුවූ වෙනස්වීම් | | | | | ප්‍රවර්තන වසරේ සිටී සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විශ්‍රාම් යෑම | ස්ථාන මාරු | | බඳවා ගැනීම් | උසස් වීම් | |
| | | | | | ගිය | පැමිණි | | | |
| **01** | අධ්‍යක්ෂ ජනරාල් | **01** | **-** | | | | | | **01** |
| **02** | අධ්‍යක්ෂ | **01** | **01** | | | | | | **-** |
| **03** | නියෝජ්‍ය අධ්‍යක්ෂ | **02** | **01** | | | | | | **01** |
| **04** | ගණකාධිකාරී | **01** | **01** | | - | | | | **01** |
| **05** | අභ්‍යන්තර විගණකාධිකාරී | **01** | | | | | | | |
| **06** | සහකාර අධ්‍යක්ෂ | **05** | **04** | **01** | | | | | **03** |
| **07** | පරිගණක පද්ධති විශ්ලේෂක/වැඩ සටහන් සම්පාදක | **01** | **01** | | | | | | **01** |
| **08** | පරිපාලන නිලධාරී | **01** | **-** | | | | | | **01 (වැ.බ )** |
| **09** | ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරී | **25** | **17** | **02** | | | | | **15** |
| **10** | සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරී<br>ඉඩම් පරිහරණ සැළසුම් සහකාර<br>සංවර්ධන නිලධාරී | **350**<br><br>**200** | **307** | | **08 (සේවයෙන් නිදහස් කිරීම)** | | 148 | | **299**<br><br>148 |
| **11** | රාජ්‍ය කළමනාකරණ සහකාර | 33 | 29 | | 02 | 02 | | 01 | 28 |
| **12** | තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර | 02 | 02 | | | | | | 02 |
| **13** | රියදුරු | 14 | 14 | | | | | | 14 |
| **14** | කාර්යාල කාර්ය සහායක | 29 | 29 | | | | | | 29 |
| **15** | අයවැය සහකාර | 01 | | | | | | | 01 |
| **16** | ශිල්පිය සහායක | 25 | 22 | | | | | | 22 |
| එකතුව | | 691 | 428 | 3 | 10 | 02 | 148 | 01 | 566 |

## 3.2. ස්ථාන මාරු පිළිබද විස්තර

| අනු අංකය | නම හා තනතුර | ස්ථාන මාරු වී ගිය | | ස්ථාන මාරු වී පැමිණි | | |
|---|---|---|---|---|---|---|
| | | දිනය | රාජකාරි ස්ථානය | අනුප්‍රාප්තිකයාගේ නම | දිනය | රාජකාරි ස්ථානය |
| 01 | වයි.එන්.පී යාපා මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර ) | 2013.01.31 | කම්කරු අමාත්‍යාංශය | කේ.ජී.චන්ද්‍රාවතී මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර -I ) | 2013.01.11 | පොලිස් දෙපාර්තමේන්තුව |
| 02 | කේ.ඩබ්ලිව් සිරිල් අබේවික්‍රම මයා (කාර්යාල කාර්ය සහායක) | 2013.01.03 | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | ජී.එච්.ජයතිලක මයා (කාර්යාල කාර්ය සහායක ) | 2013.01.31 | රේගු දෙපාර්තමේන්තුව |
| 03 | ජී.එච්.ජයතිලක මයා (කාර්යාල කාර්ය සහායක) | 2013.01.31 | කම්කරු අමාත්‍යාංශය | ඩී.ජයවීර මයා (කාර්යාල කාර්ය සහායක ) | 2013.01.31 | කම්කරු අමාත්‍යාංශය |
| 04 | අයි.ජී.දර්ශනිකා මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර ) | 2013.01.11 | දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | - | - |
| 05 | ඩී.ඒ.එස්.ජේ .දෙල්පවිත්‍ර මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර ) | 2013.02.06 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | ඩී.ඒ.එස්.ජේ .දෙල්පවිත්‍ර මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර ) | 2013.01.08 | රේගු දෙපාර්තමේන්තුව |

## 3.3.ආයතනික කටයුතු

| අනු අංකය | විස්තර | පෙර වසර (2012 ) | | | ප්‍රවර්තන වසර (2013) | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | අනුමත කල සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව | සංඛ්‍යාව | අනුමත කල සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව |
| 01 | සේවයට බඳවා ගැනීම | - | - | - | 148 | 200 | 52 |
| 02 | විභාග පැවැත්වීම | - | - | - | 01 | - | - |
| 03 | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | - | - | - | - | - | - |
| 04 | සේවය ස්ථිර කිරීම් | 08 | 08 | - | - | - | - |
| 05 | උසස් කිරීම් | - | - | - | - | - | - |
| 06 | වැටුප් වර්ධක ගෙවීම | 396 | 418 | 22 | 418 | 355 | 63 |
| 07 | සේවය දීර්ඝ කිරීම | - | - | - | - | - | - |
| 08 | බඳවා ගැනීම් පටිපාටි සැකසීම | 05 | 03 | 02 | 05 | 03 | 02 |
| 09 | සේවය හැර යාම | | | - | 01 | - | - |
| 10 | වැඩ තහනම් කිරීම | 01 | 01 | - | - | - | - |
| 11 | නැවත සේවයේ පිහිටුවීම | | | - | 01 | - | - |
| 12 | විනය පරීක්ෂණය | 01 | 01 | - | | - | - |
| 13 | විදේශ නිවාඩු අනුමත කිරීම | 01 | 01 | - | 01 | 01 | - |
| 14 | විදේශ ශිෂ්‍යත්ව | - | - | - | 01 | - | - |
| 15 | අමාත්‍ය මණ්ඩල සංදේශ | - | - | - | 01 | - | - |
| 16 | ඇප ආරම්භ කිරීම | - | - | - | - | - | - |
| 17 | ඇප නිදහස් කිරීම | - | - | - | - | - | - |
| 18 | ණය අනුමත කිරීම | 68 | 51 | 17 | 62 | 28 | 34 |
| 19 | දේපළ | 05 | 05 | - | 20 | 20 | - |
| 20 | වාහන | 24 | - | - | - | - | - |
| 21 | වෙනත් | - | - | - | - | - | - |
| 22 | මුදා හැරීම් | - | - | - | - | - | - |

## 3.4.මානව සම්පත් සංවර්ධනය

<u>විදේශීය පුහුණු</u>

| අනු අංකය | ජාත්‍යාන්තර වැඩමුළුව | නිලධාරියාගේ නම | තනතුර | විදේශ පුහුණුව ලැබූ රට | කාලසීමාව |
|---|---|---|---|---|---|
| 01 | ජාතික සිතියම්කරණය, මැනුම්කරණය සංවර්ධනය හා සැළසුම්කරණය | එස්.එච්.සි. කේ.ආරියවංශ | සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරී | ජපානය | මාස 04 |

<u>දේශීය පුහුණු</u>

| අනු අංකය | පාඨමාලාව | නිලධාරීන් සංඛ්‍යාව | තනතුර | ආයතනය | පැවැත්වූ කාලසීමාව |
|---|---|---|---|---|---|
| 01 | ඉඩම් පරිහරණ කලාපකරණය,නායයෑම්, ඉඩම් පරිහරණය හා ඉඩම් හායනය පිළිබඳ පුහුණු වැඩසටහන | නිලධාරීන් 325 | සහකාර අධ්‍යක්ෂකවරු,දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන්,සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන්,ඉඩම් පරිහරණ සැළසුම් සහකාර නිලධාරීන්,ශිල්පිය සහායක | සංවිධානය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම්දෙපාර්තමේන්තුව | දින 01 |
| 02 | පශ්චාත් උපාධි | නිලධාරීන් 09 | සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන්, ඉඩම් පරිහරණ සැළසුම් සහකාර නිලධාරීන් | පේරාදෙණිය,කැලණිය,කොළඹ,ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | අවුරුදු 1-2 |
| 03 | GIS පුහුණු | නිලධාරීන් 08 | ඉඩම් පරිහරණ සැළසුම් සහකාර නිලධාරීන් | පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනය,යාපනය හා මඩකලපුව විශ්ව විද්‍යාලය | දින 06 |
| 04 | ARC GIS පාඨමාලාව | නිලධාරීන් 01 | දත්ත විශ්ලේෂක | GIS සොලුෂන් පුද්ගලික ආයතනය | දින 05 |
| 05 | කාර්යාල ක්‍රම හා ඉඩම් පරිහරණයසැළසුම්කරණය පිළිබඳ පුහුණුව | නිලධාරීන් 130 | අලුතින් බඳවා ගත් උපාධිධාරීන් (සංවර්ධන නිලධාරීන්) | සංවිධානය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම්දෙපාර්තමේන්තුව | දින 03 |
| 06 | රාජ්‍ය නිලධාරීන් සඳහා හැකියාව පිළිබඳ පුහුණුව ICT ආයතනය | නිලධාරීන් 04 | සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන් , ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- අනුරාධපුර | දින 16 |
| 07 | භූ අවකාශීය සමුළුව (Geospatial forum) | නිලධාරීන් 04 | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ, සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන් | මැනුම් දෙපාර්තමේන්තුව | දින 01 |

| අනු අංකය | පාඨමාලාව | නිලධාරීන් සංඛ්‍යාව | තනතුර | ආයතනය | පැවැත්වූ කාලසීමාව |
|---|---|---|---|---|---|
| 08 | ඵලදායිතාවය පිළිබඳ පුහුණුව | නිලධාරීන් 05 | සහකාර අධ්‍යක්ෂ, සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන්,ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන් | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | දින 01 |
| 09 | ISO 9001-2008 තත්ත්ව සහතිකය පිළිබද පුහුණු වැඩමුළුව | නිලධාරීන් 50 | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ, සහකාර අධ්‍යක්ෂ, සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන්, ඉඩම් පරිහරණ සැළසුම් සහකාර නිලධාරීන්,රාජ්‍ය කළමනාකරණ සහකාර | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | දින 02 |
| 10 | GPS පුහුණුව | නිලධාරීන් 30 | සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන්, ඉඩම් පරිහරණ සැළසුම් සහකාර නිලධාරීන් | සංවිධානය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව | දින 01 |
| 11 | පුද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම | නිලධාරීන් 02 | රාජ්‍ය කළමනාකරණ සහකාර | හැකියා සංවර්ධනය- පුද්ගලික ආයතනය | දින 01 |
| 12 | ඉඩම් පරිහරණය සඳහා Google pro මෘදුකාංගය භාවිත කිරීම. | නිලධාරීන් 27 | ඉඩම් පරිහරණ සැළසුම් සහකාර නිලධාරීන්, සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන් | සංවිධානය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව | දින 02 |
| 13 | හැකියා සංවර්ධනය | නිලධාරීන් 03 | කා.කා.ස /රියදුරන් | හැකියා සංවර්ධන පුද්ගලික ආයතනය | දින 01 |
| 14 | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීමට දත්ත එකතු කිරීම | නිලධාරීන් 85 | උතුරු නැගෙනහිර පළාත්වල ඉඩම් පරිහරණ සැළසුම් සහකාර/ සංවර්ධන නිලධාරීන් | සංවිධානය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව | දින 02 |
| 15 | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීම ඉඩම් පරිහරණ යාවත්කාලින කිරීම | නිලධාරීන් 85 | උතුරු නැගෙනහිර පළාත්වල ඉඩම් පරිහරණ සැළසුම් සහකාර/ සංවර්ධන නිලධාරීන් | සංවිධානය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව | දින 02 |
| 16 | පාංශු විග්‍රහය පිළිබද පුහුණුව | නිලධාරීන් 20 | සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන්, ඉඩම් පරිහරණ සැළසුම් සහකාර / සංවර්ධන නිලධාරීන් | සංවිධානය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව | දින 01 |
| 17 | සම්මුඛ පරීක්ෂණ සිදු කිරීම සඳහා පුහුණුව | නිලධාරීන් 01 | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (ඉඩම් පරිහරණ සැළසුම්) | හැකියා සංවර්ධන ආයතනය | දින 01 |
| 18 | ඉංග්‍රීසි භාෂාව පිළිබද සහතික පත්‍ර පාඨමාලාව | නිලධාරීන් 03 | සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන්, ඉඩම් පරිහරණ සැළසුම් සහකාර /සංවර්ධන නිලධාරීන් | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | අවුරුදු 01 |
| 19 | දෙමළ භාෂාව | නිලධාරීන් 20 | සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සහකාර කා,කා,ස | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | මාස 10 |

# 04. මූල්‍ය කළමනාකරණය

## 4.1.වැය ඇස්තමේන්තු

| | පෙර වර්ෂය (2012 ) | | | වියදමේ ප්‍රතිශතය | ප්‍රවර්ථන වර්ෂය (2013) | | | වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | |
| 1 ව්‍යාපෘති 1 | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 130,515,345.12 | 130,232,970.90 | 282,374.22 | 99.78% | 155,789,000 | 155,740,749.59 | 48,250.41 | 99.96% |
| වෙනත් පුනරාවර්තන | 31,668,357.88 | 31,029,225.21 | 639,132.67 | 97.98% | 31,881 ,000 | 31,353,292.38 | 527,707.62 | 98.34% |
| ප්‍රාග්ධන | | | | | | | 725,562.53 | |
| 2001 | 11,000,000 | 4,630,834.62 | 6,369,165.38 | 42.09% | 9,400 ,000 | 8,674,437.49 | | 92.28% |
| 2002 | 1,800,000 | 355,998.80 | 1,444,001.20 | 19.77% | 1,800.000 | 680,096 .55 | 1,119,903.45 | 37.78% |
| 2003 | 2,727,597 | 2,727,596.82 | 0.18 | 99% | 3,800,000 | 3,146,267.82 | 653,732.18 | 82.79% |
| 2101 | - | | | | | | | |
| **2** ව්‍යාපෘති 2 | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | | | | | | | | |
| වෙනත් පුනරාවර්තන | | | | | | | | |
| ප්‍රාග්ධන | | | | | | | | |
| 2001 | | | | | | | | |
| 2002 | | | | | | | | |
| 2003 | | | | | | | | |
| 2101 | | | | | | | | |
| එකතුව | 177,711,300 | 168,976,626.35 | 8,734,673.65 | 95.08 % | 202,670,000 | 199,594,843.81 | 3,075,156.19 | 98.48% |

රජයේ අත්තිකාරම් බී ගිණුම

| සීමාවන් | පෙර වර්ෂය (2012 ) | | ප්‍රවර්ථන වර්ෂය (2013) | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය |
| උපරිම වැය සීමාව | 18,000,000 | 6,544,712.10 | 18,000,000 | 17,514,785.32 |
| අවම වැය සීමාව | 6,500,000 | 8,983,964.04 | 6,500,000 | 7,764,353.75 |
| උපරිම හර ශේෂ සීමාව | 48,500,000 | 34,401,598.53 | 60,000 | 44,152,030.10 |

## 4.2.භෞතික සම්පත් කළමනාකරණය

<u>චංචල දේපල</u>

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්ත්වය | වර්ෂය තුළ සිදුවන වෙනස් වීම් | | | | වසර අවසාන යේ පැවති තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම | මිලදී ගැනීම | වෙන්දේසි කිරීම | ඉවත් කිරීම | |
| 1 | බර වාහන | - | | | | | - |
| 2 | කැබ් රථ | 06 | | | | | 06 |
| 3 | වෑන් | 01 | | | | | 01 |
| 4 | ජීප් රථ | 15 | | | 03 | | 12 |
| 5 | මෝටර් සයිකල් | - | | | | | - |
| 6 | පාපැදි | 01 | | | | | 01 |
| 7 | ඩුප්ලිකේටර් යන්ත්‍ර | 01 | | | | | 01 |
| 8 | ඡායා පිටපත් යන්ත්‍ර | 26 | | 03 | | | 29 |
| 9 | පරිගණක | 132 | | 18 | 11 | 01 | 138 |
| 10 | පරිගණක ප්‍රින්ටර්ස් | 43 | | | 04 | | 39 |
| 11 | ලැප්ටොප් පරිගණක | 26 | | 08 | 01 | | 33 |
| 12 | ෆැක්ස් යන්ත්‍ර | 19 | | 08 | 01 | | 26 |
| 13 | යතුරු ලියන (මැනුවල්) | - | | | | | - |
| 14 | යතුරු ලියන (ඉලෙක්ට්‍රික් ) | - | | | | | - |
| 15 | සේප්පු | 01 | | | | | 01 |
| 16 | කැමරා (ඩිජිටල් ) | 26 | | | | | 26 |
| 17 | වීඩියෝ කැමරා | - | | | | | - |
| 18 | රූපවාහිනී යන්ත්‍ර | 02 | | | | | 02 |
| 19 | රේඩියෝ යන්ත්‍ර | - | | | | | - |
| 20 | ශීතකරණ | 01 | | | | | 01 |
| 21 | පරිගණක ප්‍රින්ටර්ස් (වර්ණ) | 21 | | 03 | 02 | | 22 |
| 22 | ස්කෑනර් යන්ත්‍ර | 27 | | | | | 27 |
| 23 | මල්ටිමීඩියා උපකරණ | 19 | | 07 | 02 | | 24 |
| 24 | ජී.පි.එස් උපකරණ | 52 | | 18 | | | 70 |
| 25 | අන්තර්ජාල පහසුකම් | 22 | | ADSL | | | 22 |
| 26 | ස්ලයිඩ් ප්‍රෝජෙක්ටර් | - | | | | | - |

# 05.සංවර්ධන කටයුතු

## 5.1.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සෑම දිස්ත්‍රික්කයකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඇත.මෙම කාර්යයේ ප්‍රධාන අරමුණ වනුයේ මෙරට භූමි සම්පත තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබාදීමය.එසේ වුවද බොහෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල භූමි පරිහරණය සැලකූ විට කොට්ඨාශයේ භූමියෙන් වැඩි ප්‍රතිශතයක් දැනටමත් විවිධ කාර්යයන් සඳහා භාවිත කර ඇති බව පැහැදිලි වේ.පවත්නා පරිහරණයේ සිදු කල යුතු වැඩිදියුණු කිරීම් සඳහා සංරක්ෂණය කල යුතු ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහාත් මෙම සැළසුම් බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

2013 වර්ෂයේදී ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැළසුම් 85 ක් සැකසීමට ඉලක්ක කල අතර 2013 දෙසැම්බර් වන විට මෙම කාර්යයෙන් 90%ක පමණ වැඩ අවසන් කර ඇත.

**<u>ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන</u>**



**කිලිනොච්චි දිස්ත්‍රික්කය**



**අනුරාධපුර දිස්ත්‍රික්කය**

## 5.2. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම

ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණය විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සහ සැළසුම් සකස් කිරීමේදී විවිධ තොරතුරු දත්ත සහ උපදෙස් ලබා ගැනීමටත් සැළසුම් ක්‍රියාත්මක කිරීමටත් විවිධ දෙපාර්තමේන්තු/ ආයතන වල නියෝජනයක් සහිත ඒකාබද්ධ ප්‍රවේශයක් අවශ්‍ය වේ.

01. ජාතික මට්ටම -ජාතික ඉඩම් පරිහරණ සැළසුම් මෙහෙයුම් කමිටුව
02. දිස්ත්‍රික් මට්ටම -දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම්කමිටුව
03. ප්‍රාදේශීය මට්ටම -ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැළසුම්කමිටුව
04. ග්‍රාමීයමට්ටම - ග්‍රාමීය ඉඩම් පරිහරණ සැළසුම් කමිටුව

මෙම කමිටු වලින් කාලින වැදගත්කම අනුව දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් කමිටුව සැම දිස්ත්‍රික්කයකම ක්‍රියාත්මක වේ.දිස්ත්‍රික් ලේකම්වරයා මෙම කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන අතර දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරී කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරනු ඇත.දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇති ඉඩම් පරිහරණ සැළසුම් කාර්යාල හරහා මෙම කමිටුවේ කටයුතු සම්බන්ධීකරණය සිදුවේ.මෙම කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විය යුතු අතර විශේෂ හා හදිසි රැස්වීම් කැඳවීමට දිසාපති/දිස්ත්‍රික් ලේකම්ට පිළිවන.

කමිටුවට ඉදිරිපත් වන කරුණක් පිලිබඳව තීරණයක් ගැනීම සඳහා විස්තරාත්මක අධ්‍යනයක් කලයුතු යැයි හැගෙන අවස්ථාවලදී ඒ සඳහා කමිටු සාමාජිකයන් කිහිප දෙනෙකුගෙන් සමන්විත අනුකමිටුවක් පත්කලහැකි අතර අවශ්‍ය පරිදි ඒ ඒ විෂයයන් සඳහා විශේෂඥයන්ද අනු කමිටුවට පත්කළ හැකිය.

**කමිටුවේ කාර්ය භාරය :-**

01. දිස්ත්‍රික්කය තුළ පවතින ප්‍රයෝජනයට ගත හැකි දැනට හිස්ව පවතින ඉඩම් පිළිබද තොරතුරු සොයා බැලීම හා වාර්තා කිරීම.

02. ඉඩම් පරිහරණ ක්ෂේත්‍රය තුළ යෝජිත සංවර්ධන වැඩසටහන් වලට අනුව ප්‍රමුඛතාවය දිය යුතු අංශ නිශ්චය කිරීම.

03. නාගරික සහ ග්‍රාමීය අංශයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හදුනා ගැනීම.

04. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාවට නැගෙන විවිධ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හදුනා ගැනීම සහ නිදහස් කිරීම

ඉහත ප්‍රධාන කාර්යයන්ට අමතරව පහත සඳහන් කරුණුද දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් කමිටුවේ කාර්යභාරයට අයත් වේ.

01. දිස්ත්‍රික්කය තුළ පවතින ඉඩම් පරිහරණ ගැටළු සම්බන්ධව ජාතික මට්ටමේ කමිටුවට පූර්ව දැනුම් දීමට අදාළ කටයුතු කිරීම.
02. ඉඩම් පරිහරණ වැඩිදියුණු කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් සම්පාදනය සඳහා මග පෙන්වීම.
03. දිස්ත්‍රික්කය තුළ පවතින ඉඩම් පරිහරණ සැළසුම් කටයුතු සඳහා අවශ්‍ය වන තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.
04. දිස්ත්‍රික්කය සඳහා සකස් කර ඇති ඉඩම් පරිහරණ සැළසුම් වල ක්‍රියාකාරිත්වය සහ භූමි පරිහරණය සම්බන්ධ පසු විපරම් කටයුතු කිරීම.
05. දිස්ත්‍රික්කය තුළ ඉඩම් පරිහරණයට සම්බන්ධ ආයතන අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම.
06. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලැස්මේ නිර්දේශ,සාකච්ඡා අනුමත කිරීම.

ඉඩම් පරිහරණ සැළසුම් කමිටුවේ සංයුතිය:-

01. දිස්ත්‍රික් ලේකම් (සභාපති )
02. ප්‍රාදේශීය ලේකම්වරු
03. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරී (ලේකම්)
04. පළාත් ඉඩම් කොමසාරිස් /සහකාර ඉඩම් කොමසාරිස්
05. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාපෘති )
06. දිසා වන නිලධාරී
07. මිනින්දෝරු අධිකාරී
08. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්
09. නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂ
10. පළාත් පාලන සහකාර කොමසාරිස්
11. සහකාර අධ්‍යක්ෂ,අපනයන බෝග
12. කළමනාකරු,කුඩා තේවතු සංවර්ධන දෙපාර්තමේන්තුව
13. නියෝජ්‍ය අධ්‍යක්ෂ,රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
14. ප්‍රාදේශීය කළමනාකරු,පොල් වගා කිරීමේ මණ්ඩලය
15. සහකාර අධ්‍යක්ෂ ,මධ්‍යම පරිසර අධිකාරිය

මීට අමතරව අවශ්‍ය අවස්ථාවලදී දිස්ත්‍රික් ලේකම්ගේ අභිමතය පරිදි වෙනත් දෙපාර්තමේන්තු/ආයතන සඳහා සාමාජිකත්වය ලබා දිය හැකිය.

මෙ අනුව 2013 වර්ෂයේ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් කමිටු 50 ක් පැවැත්වීමට සැළසුම් කල අතර එම කමිටු 50 ම පවත්වා ඇත.එක් කමිටුවක් සඳහා වෙන් කරන ලද මුදල රු.3000/= කි.

## 5.3.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම

දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් කමිටුවේ උපදෙස් හා මගපෙන්වීම් මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් මෙම කමිටුව ක්‍රියාත්මක වේ.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළ ඉඩම් පරිහරණ සැළසුම් වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම කමිටුවේ සම්බන්ධීකරණය මත සිදුවේ.ප්‍රාදේශීය ලේකම්වරයා සභාපතිත්වය දරණ මෙම කමිටුවේ ලේකම්වරයා ලෙස ඉඩම් පරිහරණ සැළසුම් සහකාර නිලධාරියා කටයුතු කරනු ඇත.

**කමිටුවේ කාර්යභාරය :-**

01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ඉඩම් පරිහරණ සැළසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
02. ඉඩම් පරිහරණය සම්බන්ධව ප්‍රමුඛතාවය දියයුතු  ක්ෂේත්‍ර හඳුනා ගැනීම.
03. කොට්ඨාශ තුළ පවතින ඉඩම් පරිහරණ ගැටළු හඳුනා ගැනීම,ඒවාට විසඳුම් ලබාදීම සහ අවශ්‍ය අවස්ථා වලදී දිස්ත්‍රික් කමිටුව වෙත වාර්තා කිරීම.
04. ඉඩම් පරිහරණ සැළසුම් යෝජනා මත පදනම් වූ දිගුකාලින හා කෙටිකාලින යෝජනා සඳහා ක්‍රියාත්මක වැඩපිළිවෙලක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කල යුතු කාර්යයන් ප්‍රමුඛතාවය අනුව පෙළගැස්වීම.මෙය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාර්ෂික සැලැස්මට ඇතුලත් කරගත යුතුය.
05. ජාතික/දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු වලට ඉඩම් පරිහරණ කාර්යයන් පිලිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.
06. ඉඩම් බෙදාදීම හා වෙන්කරදීම,ඉඩම් කච්චේරිය පැවැත්වීම හා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුව විසින් අනුමත කිරීම.
07. රජයේ කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම කමිටුවේ නිර්දේශය මත සිදුවේ.
08. ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ඉඩම් පරිහරණ සැළසුම් කමිටු සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම.
09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම.
10. විවිධ කටයුතු සඳහා ඉඩම් වෙන් කිරීමේදී යෝග්‍යතාවය පදනම් කරගෙන අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම්.
11. ප්‍රාදේශීය මට්ටමෙන් ඉඩම් පරිහරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම හා දිස්ත්‍රික් දත්ත පද්ධතිය හා ඒකාබද්ධ කිරීම.

**කමිටුවේ සංයුතිය :-**

01. ප්‍රාදේශීය ලේකම් (සභාපති)
02. ඉඩම් පරිහරණ සැළසුම් සහකාර (ලේකම්)
03. ඉඩම් නිලධාරී/ජනපද නිලධාරී
04. කෘෂිකර්ම උපදේශක
05. ගොවිජන සංවර්ධන නිලධාරී
06. අඩවි වන නිලධාරී
07. සහකාර මිනින්දෝරු අධිකාරී
08. පොල්/තේ/රබර්/බහු වාර්ෂික බෝග සඳහා වූ ව්‍යාප්ත නිලධාරීන්
09. පශු වෛද්‍ය නිලධාරී
10. පරිසර නිලධාරී
11. ගොවිජන සංවිධානයේ සභාපති
12. වැව්ලි සහ වතු වගා අංශයේ අදාළ නියෝජිතයින්
13. ඉඩම් පරිහරණ සැළසුම් කටයුතු වලට අදාළ රාජ්‍ය නොවන සංවිධාන වල නියෝජිතයින්

2013 වර්ෂයේ දී මෙවැනි කමිටු 400 ක් පැවැත්වීමට ඉලක්ක කල අතර එයින් කමිටු 373 ක් පවත්වා ඇත.ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල,ප්‍රාදේශීය කෘෂිකාර්මික කමිටුව එයට සමගාමීව පවත්වා අදාළ ඉලක්කය ලගාකර ගත්තද මුදල් වැය වීමක් සිදු වී නොමැත.මෙම එක් කමිටුවක් පැවැත්වීම සඳහා රු.1500/= ක මුදලක් වෙන් කර ඇත.

## 5.4.ග්‍රාමීය ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශන සැකසීම

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැළැස්මේ පළමු අවස්ථාවේ කටයුතු සිදු කරන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ඇති ග්‍රාම නිලධාරී වසම් වල දක්නට ලැබෙන ඉඩම් පරිහරණ ගැටළු සංඛ්‍යාව පදනම් කර ගෙන අදාළ සැළැස්ම ක්‍රියාත්මක කිරීමට සුදුසු ග්‍රාම නිලධාරී වසම තුළ ගමක් හෝ දෙකක් තෝරා ගනු ලැබේ.මෙහිදී එම ගම්වැසියන් එයට දක්වන සහයෝගයද සැලකිල්ලට ගනු ලබන අතර,ඒ අනුව අදාළ දත්ත රැස්කර ගම්මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් වලට අදාළ ව්‍යාපෘති වාර්තාව සකසයි.ඉන්පසුව ප්‍රාදේශීය මට්ටමෙන් සේවයේ යෙදී සිටින ඉඩම් පරිහරණ සැළසුම් සහකාර නිලධාරියාගෙන් දිස්ත්‍රික් කාර්යාල හරහා ප්‍රධාන කාර්යාලයට අනුමැතියට යොමු කරයි.එයට අදාළ අනුමැතිය ලැබීමෙන් පසුව දිස්ත්‍රික් නිලධාරියාගේ අධීක්ෂණය මත මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ. මේ සඳහා 2013 වර්ෂය මුල්‍ය ප්‍රතිපාදන වෙන්කරනු ලැබූ අතර ඒ අනුව වියදම් කටයුතු සිදු කර ඇත.2013 වර්ෂයේ ග්‍රාමීය ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශන 80 ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කල අතර එයින් ආදර්ශන 70 ක් සාර්ථකව ක්‍රියාත්මක කර තිබේ.

එක් වැඩසටහනක් සඳහා රු.100,000.00 ක මුදලක් වෙන් කරන ලදී.2012 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ ඇතැම් ග්‍රාමීය ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශන වැඩසටහන් අවිච්ඡේද වැඩසටහන් ලෙස 2013 වර්ෂයේද ඉදිරියට පවත්වාගෙන යන ලදී.එම අවිච්ඡේද වැඩසටහන් වල අවශ්‍යතාවය සලක බලා එක් වැඩසටහනක් සඳහා රු.10,000.00 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී.2013 වර්ෂයේදී මෙවැනි අවිච්ඡේද වැඩ සටහන් 50 ක් වැඩිදුර සංවර්ධනයට ඉලක්ක කල අතර එම ඉලක්කය සාර්ථක වී ඇත.

**<u>2013 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදග්‍රාමීය ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශන</u>**





**ගම්පහ දිස්ත්‍රික්කය**

## 5.5. බිම් කට්ටි මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශන

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ වඩාත් ප්‍රචලිත සංවර්ධන වැඩසටහනක් ලෙස බිම් කට්ටි මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශන සැකසීම සඳහන් කල හැකිය.මෙමගින් අපේක්ෂා කරනු ලබන්නේ කුඩා ඉඩම් ප්‍රමාණයක වඩාත් සැළසුම් සහගත වූ භූමි පරිභෝග රටාවක් ස්ථාපිත කරන ආකාරය පිළිබඳ අවබෝධයක් හා දැනුමක් ලබාදීමත් ඒ පිළිබඳ ඇල්මක් සමස්ථ ප්‍රජාව තුළ ඇති කිරීමය.පාසල් ගෙවතු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍ර ,ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍ර මේ සඳහා තෝරා ගනී.විශේෂයෙන් කෘෂි කාර්මික නැඹුරුවක් ඇති මෙවැනි කාලයක මෙම ආදර්ශන ක්‍රියාත්මක කීරීම තුළින් ජනතාව තුළ ප්‍රබෝධයක් ඇතිව තිබේ.2013 වර්ෂයේදී මෙවැනි බිම්කට්ටි මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශන 92 ක් ස්ථාපිත කිරීමට ඉලක්ක කල අතර එම වැඩසටහන් 92 ම සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.එක් වැඩසටහනක් වෙනුවෙන් රු.50,000.00 ක මුදලක් වෙන් කරන ලදී.

**2013 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද බිම් කට්ටි මට්ටමේ සැළසුම් ආදර්ශන**





**කොළඹ දිස්ත්‍රික්කය** **කුරුණෑගල දිස්ත්‍රික්කය**

මොරටුව ප්‍රාදේශීය ලේකම්කොට්ඨාශය

වල්පාළුව ප්‍රථමික විද්‍යාලය

## 5.6. හායනයට පත් ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන්

ඕනෑම භූමියක් නිසි ලෙස කළමනාකරණය නොකළහොත් එම භූමියේ තත්වය පහත වැටීම නොවැලැක්විය හැකිය.මෙලෙස නිසිලෙස කළමනාකරණය නොකරනු ලබන කෘෂිකාර්මික භූමිද විවිධ හේතු නිසා නැවත පුනරුත්ථාපනය කල නොහැකි තත්වයෙන් පහත වැටීම හෙවත් භූමි හායනයට පත් වෙමින් පවතී.මෙම වැඩසටහන යටතේ අප සලකා බලනුයේ මෙබඳු බිම් සංරක්ෂණය කර ආදර්ශමත් ලෙස භාවිතා කිරීමේ උපාය මාර්ග හඳුන්වා දීමයි.

2013 වර්ෂයේ මෙම වැඩසටහන් 59 ක් පැවැත්වීමට ඉලක්ක කල අතර එයින් වැඩසටහන් 47 ක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.එක් වැඩසටහනක් වෙනුවෙන් රු.50,000.00 ක මුදලක් වෙන් කරන ලදී.

<u>**2013 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද භායනයට පත්ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන්**</u>





**කුරුණෑගල දිස්ත්‍රික්කය** **නුවරඑළිය දිස්ත්‍රික්කය**

## 5.7. පාසල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

අනාගත පරපුර දැනුවත් කිරීම් තුලින් රටේ ඉදිරි දැක්ම ඵලදායි ලෙස සකස් කර ගැනීමේ අරමුණෙන් පාසල් ළමුන්ට ඉඩම් පරිහරණය පිළිබඳ දැනුවත් කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. අ.පො.ස.උසස් පෙළ භූගෝල විද්‍යා විෂය ධාරාවටද ඉඩම් පරිහරණ සැළසුම් විෂය ඇතුලත් කර ඇති නිසා මෙම වැඩසටහන් පැවැත්වීම වඩාත් කාලින වී ඇත.2013 වර්ෂයේදී පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් 716 ක් පැවැත්වීමට ඉලක්ක කල අතර එයින් වැඩසටහන් 654 පවත්වා ඇත. එක් වැඩසටහනක් වෙනුවෙන් රු.3000/= ක මුදලක් වෙන් කරන ලදී.

<u>**2013 වර්ෂයේ පවත්වන ලද පාසල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්**</u>








**ගාල්ල දිස්ත්‍රික්කය** **කුරුණෑගල දිස්ත්‍රික්කයහම්බන්තොට දිස්ත්‍රික්කයදික්කුඹුර මහා**
විද්‍යාලය දෙවිනුවර -උඩපාරුක්ක වලස්මුල්ල ජාතික පාසල

## 5.8.ඉඩම් යෝග්‍යතා වාර්තා සැකසීම

විවිධ භාවිතයන් සඳහා ඉඩම් යොදවා ගැනීමට පෙර එම ඉඩම් පරික්ෂා කර යෝග්‍යතා පිළිබඳ වාර්තා කිරීම ඉඩම් පරිහරණ වාර්තාවක මූලික අරමුණ වේ. පරීක්‍ෂණයට භාවිත කරන ලද ඉඩම් සඳහා සුදුසු විකල්ප පරිහරණ හඳුනා ගැනීම සඳහා ද මෙම ඉඩම් පරීක්ෂණ වැදගත් වේ. මහා පරිමාණ ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයේ ඉල්ලීම් වලට මුදල් අයකිරීම මත යෝග්‍යතා වාර්තා ලබා දීම 2011 වසරේ පටන් ක්‍රියාත්මක කරේ. මෙහිදී ලැබෙන ඉඩම් රාජ්‍ය අදායමට බැර කිරීම තුළින් ජාතික වශයෙන් ඵලදායී ක්‍රියාවලියකට සහභාගිවීමට හැකි වීම වැදගත් කර්තව්‍යකි.2013 වසරේදී මෙවැනි ඉඩම් යෝග්‍යතා වාර්තා 3566 ක් දිස්ත්‍රික් මට්ටමින් සපයා ඇත.

## 5.9. විශේෂ ව්‍යාපෘති

**(I)උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂමේ නිර්දේශ අනුව ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම.**

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂමේ නිර්දේශ පදනම් කර ගෙන ,ජාතික මට්ටමින් පත් කරන ලද විශේෂ කණ්ඩායම් මඟ පෙන්වීම යටතේ දිස්ත්‍රික් විශේෂඥ කණ්ඩායමක් මගින් උතුරු නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක සඳහා 2012 වර්ෂයේදී දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීමේ මූලික කටයුතු ආරම්භ කරන ලදී. එම වැඩසටහන් 2013 හා 2014 වර්ෂ තුලදී ඉදිරියට ක්‍රියාත්මක කරනු ලබයි.

LLRC වාර්තාවේ 9.152 ඡේදයේ සඳහන් පරිදි උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළැස්මක් සැකසීම මෙමගින් සිදු වේ.මේ යටතේ ඉඩම් සංරක්ෂණය, ඉඩම් බෙදා දීම තුලින් පරිසරය ආරක්ෂා කිරීමත්,ජෛව විවිධත්වය සුරැකීමත්,තිරසාර ආර්ථික සංවර්ධනයත් ,ජාතික හා සංස්කෘතික පුරාවිද්‍යාත්මක ප්‍රදේශ ආරක්ෂා කිරීමත් ඒ හරහා වර්තමාන හා අනාගත ජීවන තත්වය වැඩිදියුණු කිරීමත් අපේක්ෂා කෙරේ.

මේ සඳහා නිර්දේශ ලබා ගැනීම හා තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් විශේෂඥ කණ්ඩායමක් පත් කිරීම සිදුකර ඇත.

මූලික සිතියම් සැකසීම, ප්‍රාදේශීය කොට්ඨාශ මට්ටමේ දැනුවත් කිරීම් හරහා පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීම මේ දක්වා සිදුකර ඇත.අම්පාර දිස්ත්‍රික්කය තුළ මේ යටතේ ඉදිරි ක්‍රියාකාරකම් සිදුකර ඇත.

## දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම -දිස්ත්‍රික් මට්ටමේ භෞතික ප්‍රගතිය

## 2013 දෙසැම්බර් දක්වා

| දිස්ත්‍රික්කයේ නම | ඉඩම් පරිහරණ සිතියම් සකස්කළ යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ඉඩම් පරිහරණ සිතියම් සකස්කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන |
|---|---|---|
| යාපනය | 15 | 5 |
| කිලිනොච්චිය | 4 | 0 |
| මුලතිව් | 6 | 5 |
| වව්නියා | 4 | 3 |
| මන්නාරම | 5 | 5 |
| අම්පාර | 20 | 19 |
| මඩකලපුව | 14 | 14 |
| ත්‍රිකුණාමලය | 11 | 11 |
| **එකතුව** | **79** | **62** |

## LLRC වැඩසටහන ක්‍රියාත්මක කිරීම



වවුනියා දිස්ත්‍රික්කය



වවුනියා දිස්ත්‍රික්කය

දැනුවත් කිරීමේ වැඩසටහන් අවස්ථාක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් අවස්ථා

## (II)“දැයට කිරුළ” සංවර්ධන වැඩසටහන

2013 වර්ෂයේ “දැයට කිරුළ” සංවර්ධන වැඩසටහන අම්පාර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්විනි.තවද පොළොන්නරුව,මඩකලපුව ,සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කද ඇතුලත්ව දිස්ත්‍රික්ක 04 සඳහා සංවර්ධන වැඩසටහන් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාවට නංවන ලදී. අම්පාර හාඩි උසස් අධ්‍යාපන ආයතනයේදී පැවතිය“දැයට කිරුළ” ප්‍රදර්ශනයේදී අම්පාර දිස්ත්‍රික් නිලධාරීන්ගේ මූලිකත්වයෙන් සහ අනෙකුත් දිස්ත්‍රික් නිලධාරීන්ගේ සහයෝගයෙන් ප්‍රදර්ශණ කුටියක් සහ ඉඩම් පරිහරණ සැළසුම් ආදර්ශනයක් සකසා මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලදී.

මෙහිදී රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් 2013 වර්ෂයේ “දැයට කිරුළ” ජාතික සංවර්ධන ප්‍රදර්ශන භූමියේ තිබූ සියළු ප්‍රදර්ශන කුටි සහ ඒවායේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරමින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව නිර්මාණය කර ඇති හොඳම ප්‍රදර්ශන කුටිය තේරීමට ලක් කර ඇත.එම ඇගයීමේදී අප දෙපාර්තමේන්තුව විසින් එදිරිපත් කරන ලද ප්‍රදර්ශන කුටිය සහ භූමි ආදර්ශනය ලකුණු 1065 ලබා ගනිමින් විශිෂ්ඨ මට්ටමේ ප්‍රගතියක් ලබා ගන්නා ලදී.





**(III)2013 වසරේ ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් විශේෂ ව්‍යාපෘති**

- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ ඉල්ලීම පරිදි ඉඩම් වල ජල මුලාශ්‍ර සංරක්ෂණය හා ආරක්ෂා කිරීම පිළිබද ජාතික ප්‍රතිපත්තියක් සැකසීම.

- අම්පාර දිස්ත්‍රික් ලේකම්ගේ ඉල්ලීම පරිදි අම්පාර දිස්ත්‍රික්කයේ රබර් වග කිරීමට සුදුසු ඉඩම් හදුනා ගැනීම.

- පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්ක වල සතුන්ට තෘණ භුමි හදුනා ගැනීම.

- සිනි කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව මඩකලපුව දිස්ත්‍රික්කවල උක් වගාවට සුදුසු ඉඩම් හදුනා ගැනීම.(මෙම ඉඩම් හදුනා ගැනීම දිස්ත්‍රික්ක ලේකම් ගේ උපදෙස් මත සිදුවේ.)

- අත්තනගලු ඔය,ඉවුරු සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

- වැව්ල ක්ෂේත්‍රයේ දැනට භාවිත කර නොමැති ඉඩම් හදුනා ගෙන ඒවායේ යෝග්‍යතාවය නිර්දේශ කිරීම.

- තේ සහ රබර් ඉඩම් GISතාක්ෂණය උපයෝගී කර ගනිමින් සිතියම් ගත කිරීම.(කළුතර , ගාල්ල ,රත්නපුර ,කෑගල්ල, නුවර සහ මාතර යන දිස්ත්‍රික්ක)

- විශාල පරිමාණයේ ඉඩම් ඩෝසර් කිරීම පිළිබද උපදෙස් මාලාවක් සැකසීම.

## 5.10. වාර්ෂික වැඩ සැළැස්ම පිළිබඳ පුහුණු වැඩමුළුව පැවැත්වීම

2013 වසරේදී දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් සඳහා (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරී / සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරී/ඉඩම් පරිහරණ සැළසුම් සහකාර නිලධාරීන් /සංවර්ධන නිලධාරීන්/ශිල්පීය සහායක )මෙම වැඩමුළුව කොළඹ පදනම් ආයතනයේදී පැවැත්විය.මෙහිදී 2013 වසරේ වැඩසැලස්ම පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කල අතර නිලධාරීන්ගේ විෂය දැනුම වැඩි දියුණු කිරීම සඳහා විෂයානුබද්ධ දේශනා මාලාවක්ද සංවිධානය කෙරින.

## 5.11. දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය

2013 වර්ෂයට අදාලව දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය වගුවෙන් දැක්වෙන අතර එය ප්‍රස්ථාරිකව ද වැඩිදුරටත් පැහැදිලි කොට ඇත.

### දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය -2013

| වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම | 85 | 78 |
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු | 50 | 50 |
| ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු | 400 | 373 |
| ග්‍රාමීය ඉඩම් පරිහරණ සැළසුම් - නව | 80 | 70 |
| ග්‍රාමීය ඉඩම් පරිහරණ සැළසුම් - අවිච්ජේද | 50 | 50 |
| බිම් කට්ටි මට්ටමේ ඉඩම් පරිහරණ සැළසුම් -ආදර්ශන | 92 | 92 |
| හායන ඉඩම් පුනරුත්තාපන වැඩසටහන | 59 | 47 |
| පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 716 | 654 |

## දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් වල ප්‍රගතිය -2013

